රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය    இணைந்த சேவைகள் பிரிவு    COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.    சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.    Independence Square, Colombo 07, Sri Lanka

| දුරකතනය<br>தொலைபேசி<br>Telephone | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Web Site |
|---|---|---|---|
| (94) 011- 2694560 | (94) 011- 2692254 | dgcs@pubad.gov.lk | www.pubad.gov.lk |

| මගේ අංකය<br>எனது இல<br>My No | ඔබේ අංකය<br>உமது இல<br>Your No | දිනය<br>திகதி<br>Date |
|---|---|---|
| CS/DOS/05/03/01 | | 2017.12.14 |

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/**

**දෙපාර්තමේන්තු ප්‍රධානීන්/**

**දිස්ත්‍රික් ලේකම්වරුන්/**

**ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.**

**<u>සංවර්ධන නිලධාරී සේවයේ III සහ II ශ්‍රේණිවල නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම.</u>**

උක්ත කරුණ සම්බන්ධව මාගේ සමාංක හා 2016.06.10 සහ 2017.08.22 දිනැති ලිපිවලට වැඩිමනත් වශයෙනි.

02. 2013 වර්ෂයේදී සංවර්ධන නිලධාරී සේවයට බඳවා ගන්නා ලද නිලධාරීන් හට සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව වර්ෂයකට දෙවරක් බැගින් පරිවාස කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය වාර 06ක් පැවැත්විය යුතු වුවත් පරිවාස කාලය තුල එක් වරක් ද, පරිවාස කාලයෙන් බැහැරව එක් වරක්ද වශයෙන් මේ වන විට විභාග වාර 02ක් පවත්වා ඇත.

03. සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති වාර ගණනට සමාන ගණනක් විභාගය නොපැවැත්වීම මත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ජ්‍යෙෂ්ඨත්වයට හානි නොවන පරිදි, සේවා ව්‍යවස්ථාවෙහි විධිවිධානවලට අනුකූලව පැවැත්වීමට නියමිතව තිබූ විභාග අවස්ථා සංඛ්‍යාවට සමාන අනුගාමී විභාග අවස්ථා සංඛ්‍යාවක් මඟින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2016 මඟින් අවස්ථාව ලබා දී ඇත.

04. එලෙස කාර්යක්ෂමතා කඩඉම සමත් වූ පසු පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2016 අනුව සහන කාලය මවිසින් අනුමත කිරීමෙන් පසුව වැටුප් වර්ධක ගෙවන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

**කේ.වී.පී.එම්.ජේ.ගමගේ**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

සංවර්ධන නිලධාරීන් සම්බන්ධ ලිපි යොමු කිරීමේදී අදාල නිලධාරියාගේ පත්වීම් ලිපි අංකය(CS/DOS/XXXXX) සඳහන් කිරීමට කාරුණික වන්න.